

# ශ්‍රී ලංකාව සංහිඳියාවට පත්කිරීම: කාන්තාවන් කියන්නේ කුමක්ද?

## හැඳින්වීම

"ශ්‍රී ලංකාව සංහිඳියාවට පත්කිරීම: කාන්තාවන් කියන්නේ කුමක්ද?" යන්න අධ්‍යයනයන් තිහක් හරහා සංහිඳියාව පිළිබඳ ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ හඬගෑම ඉදිරිපත් කරන්නා වූ වාර්තාවකි. සංහිඳියා යාන්ත්‍රණය තුළ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ මට්ටම්වලදී කාන්තාවන්ගේ හඬ අන්තර්ග්‍රහණය කරගැනීම කලාතුරකින් සිදුවන්නකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීත්වය ඈඳා ගනිමින් හා සංහිඳියාවට ප්‍රවේශයක් ඇතුළත් කරමින් සංහිඳියා යාන්ත්‍රණයට ධනාත්මකව බලපෑම් කිරීමෙහි ලා කාන්තාවන්ගේ දැක්ම යොදාගන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම වාර්තාව විසින් පෙන්වා දේ.

සංහිඳියාව යන්න රාජ්‍ය, ප්‍රජාවන් හා විවිධ තනි පුද්ගලයන් විසින් වෙනස් වෙනස් ආකාරයන්ට වටහාගෙන ඇත. කෙසේවෙතත් එය පොදු ආකාරයෙන් පහත පරිදි හඳුනාගත හැකිය: සංහිඳියාව යනු දැවැන්ත හා පුළුල් ලෙස පැතිරුණු මානව හිමිකම් උල්ලංඝණයන්ගෙන් පසුව සබඳතා ගොඩනැගීම හෝ නැවත ගොඩනැගීම සම්බන්ධව දායක වන සංකීර්ණ යාන්ත්‍රණ මාලාවකි. එය තනි පුද්ගලයින්, පුද්ගලයින් අතර, සමාජ-දේශපාලන හා ආයතනික මට්ටම් අතර 'සියුම්' ලෙස සහභාවය සමඟ කුඩා හෝ විශ්වාසයක්, ගෞරවයක්, අගනාකම් හුවමාරු-වක් නැතිව හෝ 'දැඩි' ලෙස අභිමානය ප්‍රතිෂ්ඨාපනය, ආන්තීකරණයේ හා වෙනස්කොට සැළකීමට භාජනය කරන්නා වූ ව්‍යුහාත්මක හේතූන් හා වින්දිතයන් නැවතත් අයිතීන් දරන්නන් හා පුරවැසියන් ලෙස පත්කිරීම මත පදනම්ව විස්තර කළ හැකිය.

***පෝල් සේයිල්ස්***, *'සංක්‍රාන්තික යුක්තියේ සංහිඳියාව පිළිබඳ ස්ථානය: සංකල්ප හා වැරදි සංකල්ප' ICTJ ප්‍රවේශය* https://www.ictj.org/sites/default/files/ICTJ-Briefing-Paper-Reconciliation-TJ-2017.pdf

USAID FROM THE AMERICAN PEOPLE
Centre for Equality and Justice
Global Communities Partners for Good



'බොහෝ පර්යේෂකයන් හා වෘත්තීයවේදීන් සංහිඳියාව දකිනුයේ නිත්‍ය සාමය සඳහා අත්‍යාවශ්‍ය අංගයක්. අතීතය සමග එකඟත්වයට පත්වීම සාමය හා අනාගත සබඳතා ගොඩනැගීමට පූර්ව කොන්දේසියක් ලෙස සලකනු ලැබේ.'

**මාර්ටිනා ෆිස්චර්,** *'සංක්‍රාන්තික යුක්තිය හා සංහිඳියාව: න්‍යාය හා ප්‍රායෝගිකත්වය*

සංහිඳියාව හා සාමය ගොඩනැගීම සැළකීමේදී විධිමත් දේශපාලන විසඳුමක් නිර්මාණය කිරීමට අත්‍යාවශ්‍ය අංගයක් ලෙස බිම්මට්ටමේ සිට සමථයක් ඇති කිරීම හෝ පහළ-ඉහළ යාන්ත්‍රණය වැදගත් වේ. ගැටුම්කාරී සමාජයන් සඳහා දේශපාලන විසඳුමක් සමාජයේ ඉහළ ස්ථරයන් විසින් යෝජනා කර ක්‍රියාත්මක කරන ලද 'ඉහළ-පහළ' යාන්ත්‍රණය, බිම් මට්ටමේ ජීවත් වූ යථාර්ථයන් අල්ලා ගැනීමට අපොහොසත් වේ. එබැවින්, ගැටුම් ඇතිවීම වැළැක්වීමටත් 'පහළ-ඉහළ යාන්ත්‍රණයක් සංහිඳියාව සඳහා අත්‍යාවශ්‍ය යාන්ත්‍රණයක් ලෙස සැළකේ. මෙම ආලෝකය තුළ අතීතයේ ගැටුම්වලින් පීඩාවට පත්වූ කාන්තාවන්ගේ අදහස් සලකා බැලීම සහ ප්‍රජාවන් සමඟි කිරීම සහ සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයන් තුළ ඔවුන්ගේ අදහස් ඇතුළත් කර ගැනීම අත්‍යාවශ්‍යය.

'මෙය කෙසේ හෝ සාක්ෂාත් කර ගැනීමට, කාන්තාවන්ගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය වේ; සහ මම කොළඹ වායුසමනය කළ කාමර තුළ සිටිනා ප්‍රභූ කාන්තාවන් පමණක් අදහස් නොකරමි. මම බිම්මට්ටමේ සිටින කාන්තාවන් පිළිබඳව අදහස් කරමි. සංහිඳියාව පිළිබඳ මොනයම් හෝ ක්‍රියාමාර්ගයකට ඔවුන් ඇතුළත් විය යුතුය. ඔවුන් මින් වඩාත් පීඩාවට පත් වූ අය වෙති. මෙය හොඳින් ඉදිරියට ගෙන ඒම ඉගෙනීමට හා උපායමාර්ග සකස් කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වය අත්‍යාවශ්‍ය වේ.'

**-රජනි චන්ද්‍රසේගරම්,** *කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දමිළ ක්‍රියාකාරිනියක්-*

රාජ්‍යයේ ජනගහණයෙන් හරි අඩකට වඩා ප්‍රමාණයක අත්දැකීම් ප්‍රතික්ෂේප කළහොත් කිසිඳු සැකසුමක් අඛණ්ඩ හෝ සාර්ථක ලෙස සැලකිය නොහැකිය. 'ශ්‍රී ලංකාව සංහිඳියාවට පත්කිරීම : කාන්තාවන් කියන්නේ කුමක්ද?' යන්න සංහිඳියාවේ විවිධ පැතිකඩයන් පිළිබඳව සළකා බලමින් කාන්තාවන්ගේ අදහස් තක්සේරු කරයි. මෙම වාර්තාව මඟින් යුද්ධය හා ගැටුම් පිළිබඳ කාන්තාවන්ගේ අත්දැකීම් සහ ඔවුන්ගේ පසු විපාක හා උපදේශනය පදනම් කරගත් සාක්ෂි සඳහා ප්‍රයෝජනවත් මෙවලමකට අවශ්‍ය ලේඛනයක් සම්පාදනය කරයි.

මෙම වාර්තාව මඟින් පහත දැක්වෙන ප්‍රශ්නවලට කාන්තාවන්ගේ අත්දැකීම් හරහා පිළිතුරු සෙවීමට අපේක්ෂා කරයි:

- සංහිඳියාව යනු කුමක්ද?
- සංහිඳියාව හා සාමය ගොඩනැගීම අතර සබඳතාවක් තිබේද?
- සංහිඳියාව හා ආගම අතර සබඳතාවක් තිබේද?
- සංහිඳියාව හා සංක්‍රාන්තික යුක්තිය අතර සබඳතාවක් තිබේද?

සිද්ධි අධ්‍යයන 30 කින් සමන්විත මෙම වාර්ථාව මෑතකදී ෆෝකස් කාන්තා ආයතනය විසින් සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් සම්පාදනය කර ඇත. මෙම අධ්‍යනයේ එක් පරමාර්ථයක් වන්නේ කාන්තාවන්ට සංහිඳියාව පිළිබඳව නිදහස්ව හා ප්‍රසිද්ධියේ සිය මතය ඉදිරිපත් කිරීම හා එම මතයන් රාජ්‍යයේ ප්‍රතිපත්ති තුළට අන්තර්ග්‍රහණය කිරීමට හැකිදැයි සොයාබැලීමයි.

## සිද්ධි අධ්‍යයනය සම්බන්ධව සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූවන්ගේ විවිධත්වය සහතික කිරීම

අධ්‍යයනය සඳහා, කාන්තාවන්ගේ හඬනැගීම් පිළිබඳ විවිධ පරාසයක් ඇතුළත් කරගැනීම පෙන්නුම් කිරීමට කාන්තාවන් තිහක් අහඹු ලෙස තෝරාගන්නා ලදි. මෙම කාන්තාවන් වෘත්තිය, අධ්‍යාපන පසුබිම, වයස්, වාර්ගිකත්වය මත පදනම්ව අහඹු ලෙස තෝරාගන්නා ලදි. විවිධ පසුබිම්වලින් නියෝජනය වන කාන්තාවන්ගේ දැක්ම වාර්තාව තුළ ග්‍රහණය කරගැනීම හරහා විවිධත්වය පවත්වාගැනීමට සහතික විය.

මෙම අධ්‍යයනය පහත දැක්වෙන කාණ්ඩයන්ගෙන් සමන්විත වේ:

- සිංහල කාන්තාවන්
- දමිළ කාන්තාවන්
- මුස්ලිම් කාන්තාවන්
- මිශ්‍ර වාර්ගික කාන්තාවන්
- ක්‍රියාකාරීන්
- විද්වතුන්
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්
- දේශපාලනඥයන්
- ජනමාධ්‍යවේදීන්
- අන්තර්ජාතික සංවිධානයක නියෝජිතයෙක්
- ව්‍යවසායක අංශයේ නියෝජිතයෙක්
- රජයේ නිළධාරීන්
- යුද්ධයෙන් පීඩාවට පත් කාන්තා ගෘහමූලිකයන්
- හමුදා වැන්දඹුවන් හා
- හිටපු කාන්තා සටන්කාමියෙක්

'සමස්තයක් ලෙස සංහිඳියාව පිළිබඳ ඔවුන්ගේ දැක්ම හා ජනගහන දැක්ම හරහා කාන්තාවන් සමාජයේ සිය ස්ථානය කෙසේද යන්න පිළිබඳ සවිස්තරාත්මකව සාමූහික අදහස් ඉදිරිපත් කරයි. ප්‍රජා යාන්ත්‍රණය තුළ කාන්තාවන් පසෙකට දැමීමේ ප්‍රවණතාව හා ග්‍රාමීයව සිට පාර්ලිමේන්තුව දක්වා ප්‍රතිපත්ති සම්පාදකයන් හා තීරණ ගනුලබන්නන් හරහා පුරුෂයන් තවමත් සිටිනබව නිශ්චිත වේ.'

*-ශ්‍රී ලංකාව සංහිඳියාවට පත්කිරීම: 'කාන්තාවන් කියන්නේ කුමක්ද?', 1 පිටුව.*

## සංහිඳියාව පිළිබඳ කාන්තාවන්ගේ දැක්ම

සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳව සම්මුඛ සාකච්ඡාවට භාජනය වූවන්ගේ මතයන් [...] ධනාත්මක හා බලාපොරොත්තු සහිත සියල්ලේ සිට සෘණාත්මක හා සැකසහිතභාවයට දිවයයි. ඔවුන් බොහෝදෙනෙක් අවධාරණය කර සිටියේ සංහිඳියාව ඉදිරියට ගෙනයාමේ කාර්යය සඳහා වත්මන් රජය කෙරෙහි ඔවුන්ට විශාල බලාපොරොත්තු ඇති බවයි. එහෙත් ඔවුන් වසර ගණනාවක් තිස්සේ බොහෝ පසුබෑම්වලට ලක් වී ඇති අතර, ඔවුන්ගේ සුභවාදී හැඟීම් අවුස්සමින් සිටීමට එය හේතු වේ.

## සංහිඳියාව පිළිබඳ ක්‍රියාවලියක් සිදුකරන්නේ කෙසේද?

මෙහිලා සංහිඳියාවේ අරමුණ අවබෝධ කරගැනීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ආගම හෝ ජනවාර්ගිකත්වය පිළිබඳව තැකීමකින් තොරව සියලුදෙනාට සමානව සළකනු ලබන සමාජයක් බිහිකිරීම සංහිඳියාව මඟින් උත්සාහ කරන බව පැවසිය හැකිය. සංහිඳියාත්මක



වෑයම්වල සාර්ථකත්වය රඳා පවතිනුයේ එයට තිරසර සාමයක් හා ප්‍රචණ්ඩත්වය යළි ඇති වීම වැලැක්වීමට ඇති හැකියාව මතය. එබැවින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී මෙන්ම ඒවා අන්තර්ග්‍රහණය කරගැනීමේදී ද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවය අත්‍යාවශ්‍ය වේ. සංහිඳියා ක්‍රියාවලියට අව්‍යාජ ලෙස දායක වීම සඳහා සංහිඳියාවට අදාළ කාර්යයන්හි නියැලී සිටින්නන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා වාර්ගිකත්වය පිළිබඳ සිය ඒකාකෘතිමය ආකල්ප ඉවත් කරගැනීම අත්‍යාවශ්‍යයෙන්ම විය යුතුය.

සමස්ථයක් ලෙස මුළු සමාජයම සංහිඳියා ක්‍රියාවලියේ හිමිකම අත්පත් කරගැනීම සිදුවිය යුතුය. එය සංහිඳියාව තුළින් තිරසර බලපෑමක් ඇති කිරීමට සමත් වේ. එබැවින්, එබැවින් සංහිඳියාව පිළිබඳ ආඛ්‍යානයට සමාජයේ සියලුම කොටස්වල අදහස් අන්තර්ගතවන එකක් විය යුතුය. සංහිඳියා ක්‍රියාවලිය පිළිබඳ සංවේදීතාවය හා අන්තර්ග්‍රහණය වැඩිකිරීම මත සමාජයේ සියලු පාර්ශ්වකරුවන් විසින් ධනාත්මකව ලබාගත් හා ක්‍රියාකළ සංහිඳියාව පිළිබඳ ජාතික ආඛ්‍යානයක් හඳුන්වාදීමට හැකිවනු ඇත. ගැටුමේ මූලාරම්භක සාධකයන් ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම ආඛ්‍යානය පිළිබඳ ස්වභාවයක් තවදුරටත් ඉලක්කගත කළ යුතුය. එබැවින්, සියලුම ශ්‍රී ලාංකිකයන් සමානව ඇතුළු කිරීමට උත්සාහකිරීමට හා ජාතිවාදී ලැදියාවන් රහිතව අන්තර්ගත කරමින් එය සකස් විය යුතුය.

‘ගැටුම සඳහා බොහෝ හේතු තිබුණ අතර මෙම හේතුන්ගෙන් සමහරක් තවමත් හඳුනාගෙන නැත. එය ආරම්භ වූයේ මිනිසුන්ට වෙනස්ව සැලකීම හා මානුෂිකත්ව නොසළකා හැරීම නිසාය. සෑම අයෙකුටම අයිතිවාසිකම් තිබිය යුතුය (ජීවිතයට, යාමට ඊමට, ආගමට, භාෂාවට, දේශපාලනයට ආදිය). සෑම කෙනෙකුම ශ්‍රී ලාංකිකයෙකු ලෙස සැලකිය යුතුය.’

*-හිටපු සිංහල කාන්තා සටන්කාමියෙක්-*

ජාතික ආඛ්‍යානයට තනිපුද්ගල හා ප්‍රජා ආඛ්‍යානයන් ද අන්තර්ගත කිරීමට සළකා බැලිය යුතු අතර සියලුදෙනාටම තමාගේ කතාන්දර අසා සළකා බලා ඒවා අන්තර්ගතකළ බවක් හැඟී යා යුතුය. මේ සම්බන්ධයෙන් සියලු ප්‍රජාවන්ගේ ආගමික නායකයින් සමඟ ක්‍රියාකර ඔවුන්ගේ අදහස් අන්තර්ගත කරගැනීමද වැදගත් වේ.

‘සංහිඳියාව පිළිබඳ ක්‍රියාවලියක් ආරම්භ කිරීම සඳහා ජාතික ආඛ්‍යානයක් සකස් කිරීමට අපට අවශ්‍ය වේ. එය සකස් කිරීම හොඳ හදවතක් හා විවෘත මනසක් ඇති කීපදෙනෙකු විසින් සිදුකළ යුතු අතර ඔවුන් අදාළ මූලාරම්භක සාධකයන් ආමන්ත්‍රණය කරමින් ප්‍රජාවන් එක්ව ගෙන ඒමේ වැදගත්මක අවබෝධ වන; ඔවුන්ට යමෙකු හෝ අරමුදල් සපයනවාය යන්න මත නොව එය රට තුළ අව්‍යාජ අවශ්‍යතාවක්ය යන අවබෝධය ඔවුන් තුළ තිබිය යුතුය.’

***-ෆේරියල් අෂ්රොෆ්,** දේශපාලනඥයෙක්-*



## සංහිඳියාව පිළිබඳ ශුභවාදය සඳහා කාන්තාවන්ගේ හේතුන්

මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට ලක්කළ කාන්තාවන්ගෙන් සමහරක් වත්මන් රජයට සංහිඳියාව පිළිබඳ ශුභවාදී හැඟීමක් ඇති නිසා එය සංහිඳියාව ඇතිකිරීමට කටයුතු කරනු ඇති බවට අදහස් පළකරන ලදි. වාර්ගික හා ජාතිවාදී එදිරිවාදිකම් නවතාදැමීම සම්බන්ධයෙන් රටේ වර්තමාන පරිපාලනයටද ප්‍රශංසා කර ඇත.

සංහිඳියාව සාක්ෂාත් කරගැනීම සඳහා ධනාත්මක දායකත්වය ලබාදිය හැකි සාධකයක් ලෙස සංස්කෘතීන් පුරා පවතින සමානකම්ද සඳහන් කර ඇත.

සන්නද්ධ ගැටුම්හි අවසානයද සියලු ජාතීන් විසින් භුක්ති විඳින සහනයක් ගෙන එන ලදි. මෙය සංහිඳියාව පහසුකිරීමට ධනාත්මක සාධකයක් ලෙස සැළකේ. එපමණක් නොව, පශ්චාත් යුද සන්දර්භය තුළ ප්‍රජාවන් හරහා සාමය ප්‍රවර්ධනය කිරීමේ ජනතාවගේ අභිලාසය සඳහා පහසුකම් සපයා ඇත.

## සංහිඳියාව පිළිබඳ සැකසහිතභාවය සඳහා කාන්තාවන්ගේ හේතු

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මෙම පශ්චාත් යුද සමය තුළ සංහිඳියාව යන පදය සම්බන්ධයෙන් මම අපහැදිලිතාවකින් සිටිමි. ඇතැම් ජන කොටස්වල දශක ගණනාවක් තිස්සේ ව්‍යුහාත්මක අසමානතාවන් පිළිබඳ ඓතිහාසික සන්දර්භය සැළකිල්ලට ගැනීමේදී එම පාරිභාෂිතයන් භාවිත කරන ආකාරය මා හට සැකසහිත වේ. මෙම පදයෙන් විපතට පත් ජනතාවට සමාව දීමට, සමගි සන්ධානවීමට හා ඉන් ඉදිරියට ගමන් කිරීමට අදහස් කරන බව පෙනේ. එහෙත් මේ සම්බන්ධයෙන් ඉදිරියට යාමට අතීතයේ වූ සියලු දේ සඳහා වගවීම හා යුක්තිය තවමත් කොහේද?

*-**සරලා එම්මානුවෙල්,** මඩලපුවේ සංවර්ධනය පිළිබඳ වෘත්තියවේදීනියක්-*

සංහිඳියාව ඉදිරියට ගෙනයාමේ වැඩකටයුතු පිළිබඳව රජය විසින් අනුගමනය කරන ලද උපායමාර්ග පිළිබඳ විනිවිදභාවය පිළිබඳ කාන්තාවන් නොසළකා හැරීම ගැන සැළකිලිමත් විය. අධ්‍යයනය මඟින් අනාවරණය කරනුයේ කාන්තාවන් දකින ආකාරයට විනිවිදභාවයක් නොමැතිවීම මෙහි බාධකයක් බවයි, සංහිඳියාව සම්බන්ධ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් ජනතාවගේ ප්‍රවේශය හා ඒ සම්බන්ධව කටයුතු කිරීම සඳහා රාජ්‍යයේ වගවීම වඩාත් වැඩිකිරීමට රාජ්‍ය විසින් අවශ්‍ය ආරම්භය ගැනීම හරහා මෙය ජයගත හැකිවනු ඇත, එවන් වගවීම තවදුරටත් රාජ්‍ය මඟින් අත්තනෝමතික ක්‍රියාවන් වැළැක්වීමට හා ජනතාවගේ සජීවී යථාර්ථයන්ට ප්‍රතිචාර දක්වන සංහිඳියා යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය බලගන්වනු ඇත.

පවත්නා සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ ඍණාත්මක හැඟීම් ඇතිකරන සාධකයක් ලෙස දිගින් දිගටම පැවතුණු දේශපාලනික උපායමාර්ගයන් හේතු වූ බව ඇතැම් කාන්තාවන් පෙන්වා දේ. අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට ලක්කළ ඇතැම් කාන්තාවන් ප්‍රකාශ කළේ එවැනි දේශපාලනික උපායමාර්ගයන් සඳහා ජනවර්ගයන් පුරා සිටින දේශපාලන ක්‍රියාකාරීන් වරදකරුවන් වන බවයි, තවදුරටත් සඳහන් වූයේ, ඇතැම් වාර්ගික ගැටුම් ප්‍රජාවන් අතර ඇතිවීම සඳහා එම දේශපාලනික උපායමාර්ගයන් හේතුවූ බවයි, සන්නද්ධ ගැටුම් අවසන් වුවද එවැනි ක්‍රියා සිදුකිරීමේ හැකියාව ස්ත්‍රීන් කෙරෙහි සැළකිලිමත්වීම සඳහා ප්‍රධාන හේතුවක් වේ.

රාජ්‍ය හා සමාජය අතර අර්ථවත් සම්බන්ධතාවක් නොමැති බව කාන්තාවන් විසින් නිරීක්ෂණය කරයි, සාමාන්‍යයෙන් කාන්තාවන්, සුළුතරයන් හා බිම් මට්ටමේ සිටින ජනතාව තීරණගැනීමේ ක්‍රියාවලියෙන් බැහැර කරනු ලබන අතර එය සංහිඳියා ක්‍රියාදාමය කෙරෙහි අහිතකර ලෙස බලපායි. ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 52% කාන්තාවන් වුවද ගම්සභා මට්ටමේ සිට පාර්ලිමේන්තුව දක්වා තීරණ ගැනීමේ තනතුරු දරනුයේ ප්‍රතිපත්ති තීරණය කරන මට්ටමේ සිටින ප්‍රධාන වශයෙන්ම පුරුෂයන් විසිනි.

කාන්තාවන් සම්බන්ධයෙන් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අන්ධ විධානයන් හා ප්‍රධාන ප්‍රවාහය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ නොතැකීම මත එය සංහිඳියා ක්‍රියාදාමයට ඍණාත්මකව බලපෑම් එල්ලකර ඇත.

සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ ඇතැමුන් ප්‍රකාශ කළේ, සංහිඳියාව පිළිබඳ සමස්ථ භාරය සුළුතරයන් විසින් දැරිය යුතුවන බවට වන සාමාන්‍ය හැඟීයාමක් ඇතිව ඇති බවයි, එවැනි ආකල්ප අර්ථාන්විත සබඳතාවක් නොමැති වීම හා දෝෂාරෝපණය කරන සංස්කෘතියට දායකත්වයක් දක්වයි. සමාජයේ සියලු පාර්ශ්වයන් විසින් සංහිඳියා යාන්ත්‍රණයට දායක නොවී එක් එක් තෝරාගත් කණ්ඩායමක් මත අදාළ බරපැන පැටවීම නිසා එය සංහිඳියා ක්‍රියාදාමයට බාධාවක් ලෙස සැලකේ. එබැවින්, බහුතර ප්‍රජාව සුළුතර ප්‍රජාවන් වෙත ප්‍රවේශවීමට හා සංහිඳියා ක්‍රියාදාමයට අව්‍යාජව දායකවී කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

ප්‍රධාන වශයෙන් කොළඹ ආශ්‍රිත ප්‍රදේශවල බහුලව පදනම්ව සිටින ප්‍රතිපත්ති සම්පාදකයින් හට බිම්මට්ටමේ පවතින ජීවමාන යථාර්ථයන් පිළිබඳව අවබෝධයක් නොමැතිවීමද සඳහන් විය. සම්මුඛ සාකඡාවට බඳුන් වූ ඇතැම් අය පෙන්වා දුන්නේ දුන්නේ, ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් බිම්මට්ටමේ සිටින ජනතාව සමඟ කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් උත්සාහයක් ගෙන නොතිබුණු බවයි. අධ්‍යනයේ නියැලුණු කාන්තාවන් අවධාරණය කළේ තිරසාර සාමයක් ගොඩනැගීම සඳහා සවිස්තරාත්මක පුළුල් ප්‍රතිපත්ති අත්‍යාවශ්‍ය බවයි.

ඉහතින් සඳහන් කර ඇති සළකාබැලීම් හේතුවෙන් ඇතැම් කාන්තාවන්ගේ මතය වූයේ, සංහිඳියාව ළඟාකරගැනීම සඳහා සමාජයේ සියලු මට්ටම්වල අව්‍යාජ උත්සාහයක පැවැත්මක් නොමැති බවයි.

'කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිපූරණයන්ට ප්‍රවේශය ඇති දිස්ත්‍රික් මට්ටමේ කාන්තා කණ්ඩායම් නායකයෙකු ලෙස, මම ආණ්ඩුව සිදුකරන්නේ කුමක්ද යන්න පිළිබඳව - සංහිඳියා කාර්යය සිදුකරන්නේ කෙසේද? එය ළඟාකරගැනීමට ඔවුන් සැලසුම් කරන්නේ කුමක්ද යනාදිය පිළිබඳ තවමත් දැනුවත්භාවයක් නොමැත. මෙය පරිපූර්ණ නොවේ. ජනතාවට උපදෙස් ලබාදෙන පාරදෘශ්‍ය යාන්ත්‍රණයක් රජය විසින් ක්‍රියාවට නැංවිය යුතු අතර එය ඉදිරියට පවත්වාගැනීම සඳහා එම ක්‍රියාවලිය අනුගමනය කළ හැකිය.'

- ***වාසුකී ජෙයසන්කර්,*** *මඩකලපුවේ ක්‍රියාකාරිනියක්* -

## සංහිඳියාව හා සංක්‍රාන්තික යුක්තිය හා සාමය ගොඩනැගීම අතර පවත්නා සබඳතාවය

සංක්‍රාන්තික යුක්තිය හා සාමය ගොඩනැගීම සම්බන්ධව සංහිඳියාවට සෘජු සබඳතාවක් ඇතිබව අධ්‍යයනයට සහභාගී වූ සියලුම දෙනා පිළිගන්නා ලදි.

'සංක්‍රාන්තික යුක්තිය අත්කර ගතහැක්කේ සැබෑ සංහිඳියාව ළඟාකරගන්නේ නම් පමණි. පළමුව ඔවුන්ට සිදුවූයේ කුමක්ද යන්න ආමන්ත්‍රණය කිරීමෙන් තොරව අතුරුදහන්වූවන් පිළිබඳව සංතාපවීම හෝ මරණයන් පිළිබඳ ශෝකවීම පිළිබඳ දෙයක් අපට ජනතාවගෙන් අපේක්ෂා කළ නොහැකිය.'

***-උදයානි නවරත්නම්,*** *යාපනය කාන්තා සංවර්ධන නිළධාරී-*

ප්‍රතිචාර දැක්වූ කාන්තාවන් තිහකගෙන් විසි නවයක්ම සඳහන් කළේ සංහිඳියාවේ හා සංක්‍රාන්තික යුක්තියේ ස්වභාවික ඵලයක් ලෙස සාමය ගොඩනැගීම සැලකිය හැකි බවයි. දැනට ක්‍රියාත්මකවෙමින් පවත්නා සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සංහිඳියාව නිර්මාණය කිරීමට අර්ථාන්විත උත්සාහයන් අනුගමනය නොකළහොත් ඒවා අර්ථවිරහිත වන බව සඳහන් කරන ලදි.

සංහිඳියාව, සංක්‍රාන්තික යුක්තිය හා සාමය ගොඩනැගීම අතර සබඳතාවන් ඇතිකරගැනීමට වන භියෝගයන් පිළිබඳවද මෙම අධ්‍යයනය හරහා අනාවරණය කරයි. විසඳාගත යුතු උභතෝකෝටිකයන් පහතින් දැක්වේ:

i) ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස් විසින් කරන ලද ඉල්ලීම්වලට අනුකූල වන ලෙස ශ්‍රී ලංකාව සඳහා තෝරාගත යුතු සංහිඳියා ක්‍රියාදාමයේ ස්වභාවය කුමක්ද?

'සංහිඳියාව හා සාමය ගොඩගැනීම අතර සබඳතාවය ජාතිවාදය ඇවිස්සීමත් සමඟ හා නැවත වරින් වර හිතාමතාම දරන උත්සාහයන් නිසා ස්ථාපිත කිරීමට අපහසු වී තිබේ. සාමය ගොඩනැගීම සඳහා අන්තර්වාර්ගික සහයෝගීතාවය අත්‍යාවශ්‍ය වේ.'

*-කාන්තා දේශපාලනඥයෙක්-*

ii) අන්තර්-වාර්ගික සහයෝගීතාවය නොමැතිකම හා සාමය ගොඩනැගීම කෙරෙහි බලපාන ද්වේශ සහගත හැඟීම් ඇතිකිරීමට බලපාන හිතාමතා වන උත්සාහයන් වළක්වාගන්නේ කෙසේද?

iii) චෝදනා එල්ලකරන ලද අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගැටුම්කාරී අදහස් සමඟ සමථයකට පත්වන්නේ කෙසේද?

'සංක්‍රාන්තික යුක්තිය හොඳයි. නමුත් මාගේ මතය අනුව එය අනිවාර්ය නොවේ. එල්ටීටීඊය විසින් පන්න දමනු ලැබූ හා එල්ටීටීඊය සම්පූර්ණයෙන් විනාශ වූ පසු මන්නාරමට නැවත පැමිණි මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස උතුරේ මුස්ලිම්වරුන් ලෙස මා හට කිව හැක්කේ අප අත්විඳි දේ සම්බන්ධව සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව කිසිඳු අපේක්ෂාවක් අපට නොමැති බවයි. අප එය බලාපොරොත්තු වන්නේවත් නැති මාගේ ප්‍රජාවගේ දෘෂ්ටි කෝණයෙන් සංක්‍රාන්තික යුක්තිය යනු රැවටිල්ලකි. වගකිව යුත්තේ කවුද? එය ලබා දෙන්නේ කවුද? ඔවුන්ට කළ හැක්කේ කුමක්ද?'

***-ජැනූරියා බෙගම්,*** *මන්නාරමේ සංවර්ධන වෘත්තීයවේදිනියක්-*

iv) දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය විසින් මුස්ලිම් ප්‍රජාවට එරෙහිව සිදුකළ කුරිරුකම් හමුවේ වුවද, උතුරු හා නැගෙනහිර පළාත්වල මුස්ලිම් ප්‍රජාව සංහිඳියා ක්‍රියාදාමයෙන් ඉවත්කිරීම සම්බන්ධයෙන් ගටලු විසඳීම සඳහා කටයුතු කරන්නේ කෙසේද?

'ශ්‍රී ලංකාව තුළ සිංහල හා දමිළ ප්‍රජාවන් අතර ආතතිය සංහිඳියාව පිළිබඳ කතිකාවට කේන්ද්‍රගත වී ඇති අතර සමහර අවස්ථාවලදී, එය අනෙකුත් ප්‍රජාවන් අතර හා සැලකිය යුතු මුස්ලිම් ප්‍රජාවන් අතර වන ආතතීන්ගෙන් ඈත්වී තිබේ.'

*-නීති ශිෂ්‍ය, මුස්ලිම්, කොළඹ-*

v) හමුදා භටයින්ගේ පවුල්වලට හා හමුදා වැන්දඹුවන්ට සාධාරණය ඉටුකරන්නේ කෙසේද?

'අපට අහිමි වූ දේ දෙස ආපසු හැරී බැලීමේදී, අපට කුමන හෝ යුක්තියක් ලැබුණේද යන්න ප්‍රශ්න සහගත වේ. හමුදා භටයින් හා හමුදා වැන්දඹුවන් පිළිබඳව කතා කර උපහාර දක්වනු ලබන අවස්ථාවලට උදාහරණ තිබේ කෙසේවෙතත්, මෙම උත්සව නොමැතිනම් මිනිසුන්ට හමුදා භටයින් හෝ හමුදා වැන්දඹුවන් පිළිබඳව මතකයක් නැත. සිංහල පුවත්පත්වලට අපව මතක තිබෙන්නේ සතිකයක් පමණයි; එහෙත් මෙය අපට ජීවිතය පුරාම වන අත්දැකීමකි. දුක්විඳින, මියගිය හෝ වැන්දඹුවන් බවට පත්වී සිටින අය සඳහා යම්කිසි වන්දි ගෙවීමක් හෝ යුක්තියක් තිබේදැයි මම සැකයක් වේ.'

*-හමුදා වැන්දඹුවක්, කුරුණෑගල-*

'කාන්තාවක් වැන්දඹුවක් වූ පසු ඇයට සියලු දේම අහිමි වේ. වැන්දඹුවකගේ අයිතිවාසිකම් සහතික කළයුතු අතර ඇයගේ ආත්ම විශ්වාසය වැඩිදියුණු කළ යුතුයි එසේම මානසික අවශ්‍යතා සමඟ කටයුතු කිරීමට මනෝ උපදේශනයද අවශ්‍ය වේ. ඔවුන්ට දැඩි පාඩුවක් සිදු වී ඇති අතර ඔවුන්ගේ ජීවිත යථා තත්වයට ගෙන ඒමට අවශ්‍ය වේ.'

***-ශීලා රත්නායක,*** *විධායක අධ්‍යක්ෂ - රජරට ප්‍රජා කේන්ද්‍රය-*

## සංහිඳියාව හා සංවර්ධනය අතර ඇති සබඳතාවය

සංහිඳියාව සමඟ සංවර්ධනයට සෘජු සබඳතාවක් ඇත්දැයි ප්‍රතිචාර දැක්වූවන්ට නිශ්චිතතාවක් නොතිබිණි. සංහිඳියාව හා සංවර්ධනය අතර සබඳතාවක් ගොඩනැගූවන් අවධාරණය කළේ සංවර්ධනය හුදු යටිතල ව්‍යුහය සංවර්ධනය කරන බවයි. එසේම, විවිධ අවස්ථාවන් සඳහා වෙනස්වීමට ජනතාවට හැකියාවක් අවශ්‍ය සේම එම සංවර්ධනයට ආකල්පමය වෙනසක්ද අවශ්‍ය බව අවධාරණය කරන ලදි.

'ප්‍රජා කටයුතුවල නිරත වී සිටින හා එය දිගටම සිදුකරගෙන යන පුද්ගලයෙකු වශයෙන් අප සියලු දෙනා එකට එක්ව සිටිනවා නම් අපට ආකල්පයන් පවා වෙනස් කළ හැකි බවයි.'

***-නිර්ති තනුජා,*** *ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරිනියක්, හම්බන්තොට-*

'සංවර්ධන වෘත්තිකයින් සංවර්ධනය පිළිබඳව කතා කරන විට ඔවුන් විසින් 'මෘදු සංරචක' එනම්: යැපීම, ස්ථාවරභාවය, තිරසරභාවය, ඉවසීම, ප්‍රත්‍යස්තිථිය හා වගවීම යනාදිය පිළිබඳව අවධාරණය කරයි. මේ හැමදෙයක්ම සංවර්ධනයේ සැබෑ අර්ථයට අත්‍යාවශ්‍ය වේ. පෙර තිබූ ආණ්ඩුව සිදුකළ වැරැද්ද මෙයයි. ඔවුන් සරලව සිතුවේ පාරවල් හා පාසල් හැදීමෙන් යුද්ධයෙන් ඇති වූ තුවාල සුවකළ හැකි බවයි එහෙත් එය එසේ නොවීය.'

*-රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්, මඩකලපුව-*

## සංහිඳියාව තුළ ආගමේ භූමිකාව

'ආගමට අයත් ඕනෑම කාර්යභාරයක් ආගමේ අත්‍යාවශ්‍ය දේ මත පදනම් වේ. මෙය හැමවිටම සිදු නොවේ. සංහිඳියා ක්‍රියවලියට හානිකරන මූලධර්මවාදීන් සිටීම මෙහිදී මූලික වේ.'

***-මහාචාර්ය ශාර්යා ස්කානිවල්,*** *කොළඹ විශ්වවිද්‍යාලය-*

ඇතැම් ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කර සිටියේ ආගමට සංහිඳියාවට අදාළව භූමිකාවක් නිරූපණය කිරීමට ඇති බවයි. කෙසේවෙතත්, බොහෝ දෙනෙක් ඊට විරුද්ධ වෙමින් දක්වා සිටියේ සංහිඳියාවට අදාළව ආගම භාවිත කිරීමේ යම් හානියක් ඇති බවයි.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සමහරක් දැඩි මතධාරී හැඟීම් පිළිබඳව සැළකිලිමත් විය. මෙය ජනවර්ගයන් අතර අවිශ්වාසය හා ප්‍රතිඝතිකතාවන් සඳහා දායක වීමක් ලෙස හඳුනාගන්නා ලදි. සංහිඳියා ක්‍රියාදාමය තුළ ආගම නිවැරදි ලෙස භාවිත කිරීම විවිධ කණ්ඩායම් අතර සමානකම් අවධාරණය කිරීමට දායක විය යුතු අතර සංහිඳියා ක්‍රියාදාමය සඳහා ආධාර කිරීම, ප්‍රායෝගිකව ආගමික වෙනස්කම් පශ්චාත් යුද සන්දර්භය තුළ ගැටුම් ඇතිකිරීමට හේතු වී තිබේ.

කාන්තාවන් ප්‍රකාශ කළේ ආගම භාවිත කරනුයේ විශේෂයෙන්ම යම් ආගමක් තවත් ආගමකට වඩා උසස් යැයි පෙන්නුම් කිරීමේ කාරණය සඳහා බවයි. එවැනි ප්‍රවේශයන්, ආගමික බෙදීම්වලට දායක විය හැකි අතර යුද්ධයෙන් පසුව යළි ගොඩනැගීමට පොරබදිමින් සිටින රටට සෘණාත්මකව බලපානු ඇත.

'මෙම ක්‍රියාවලියේදී ආගමේ කාර්යභාරය; එය හැසිරවීමට තරමක් අපහසු දෙයකි. එය උපකාරවත් විය හැකිය. එහෙත් විකල්පයක් ලෙස එය සමස්ත ක්‍රියාවලියටම බාධාවිය හැකිය. සංවේදීතාවය ප්‍රධාන වේ. එය ඉතා සංවේදීව හැසිරවුවහොත් එය යහපත සඳහා ශක්තියක් විය හැකිය.'

*-**වාසුකී ජෙයසන්කර්,** මඩකලපුවේ ක්‍රියාකාරිනියක්-*

ආගම පිළිබඳ පොදු අවබෝධය තනිපුද්ගල හා පෞද්ගලික ක්ෂේත්‍රයේ තීරණය කිරීම සඳහා රාජ්‍ය අනුමැතිය හා ප්‍රමුඛත්වය ලබාදීම දඬුවම් දීමකට වඩා සිදුකළ යුතුය. කෙසේවෙතත් කාන්තාවන් දක්වා සිටියේ: 'අප ඉදිරියට යනවිට ආගම අත්හැරිය නොහැකි බවයි. ශ්‍රී ලාංකිකයන්ට දැඩි සංස්කෘතික මූලයන් ඇති අතර ආගම බොහෝ අයගේ ජීවන රටාවේ කොටසකි. ඊට අමතරව, ආගමික නිදහස හා සමානාත්මතාවය තහවුරු කිරීම සංහිඳියාවට අත්‍යාවශ්‍ය වේ. වාර්ගිකත්වය හා භාෂාව මත ආගම යන්න බොහෝවිට නොපෙනී තිබෙන මානයක් විය හැකිය.'

*-දේශපාලනඥයෙක්-*

සමහරුන් විසින් ආගමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇති අතර සංහිඳියාවේ රජයේ නිල ප්‍රයත්නයේදී අගම භාවිත නොකළ යුතු බව ප්‍රකාශ කර ඇත. අවධාරණය කළ මතයක් වූයේ සමාජයේ එකමුතුබව නැතිකිරීමට ආගම දේශපාලනීකරණය කිරීම අපරාධයක් බවට පත්කළ යුතු බවයි.

'ආගම වැදගත් වන අතර එය පොදු කාරණයක් නොව පෞද්ගලික කාරණයක් විය යුතුය. එහෙයින් සංහිඳියා ක්‍රියාදාමයේදී එයට ප්‍රමුඛත්වය දිය යුතුයැයි මම නිර්දේශ නොකරමි. අවධානය දිය යුත්තේ ආගමික සංවේදීතාවටය, කෙසේවෙතත්, එමනිසා මිනිසුන්ට වරදක් වන ආකාරයෙන් ඔවුන් අනවධානව ඉදිරියට යාම සංහිඳියා ක්‍රියාදාමය පසුපසට ඇදදැමීමක් වනු ඇත. එබැවින් සංවේදීව හා දනුවත්ව සිටිය යුතු අතර එහෙත් සංහිඳියා සංකල්පය තුළට ආගම අධිකව ගෙන නොයා යුතුය.'

*-**ජැනූරියා බෙගම්,** මන්නාරම සංවර්ධන වෘත්තීයවේදීනියක්-*

ඇතැම් ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන මතය වන්නේ, ආගමක් අනුගමනය කිරීමේ කැමැත්ත සදාචාරාත්මක හා අචාර ධර්මානුකූල මඟපෙන්වන පදනමක් මිනිසුන්ට ලබාදෙන සාමකාමී ජීවිතයක රාමුවක් ලෙස ආගම සැළකිය යුතු බවයි. එබැවින් ඇතැමුන්ගේ දැක්ම වන්නේ තනි පුද්ගල හා සාමූහික සාමයක් සමස්ත සමාජය තුළ ක්‍රමිකව ස්ථපිත කිරීමට තුඩුදෙනු ඇති බවයි.

'සංහිඳියා ක්‍රියාදාමයේදී විවිධ ජනවර්ගයන් හා ප්‍රජාවන් එකිනෙකා අතර හුවමාරු වනවිට එකිනෙකා පිළිබඳ ඔවුන්ගේ අවබෝධය එකිනෙකාගේ ඒකාකෘති බිඳ දැමීමට උපකාරී වනු ඇත - වෙනත් සමාජීය නිර්මාණ අතර බොහෝ විට ආගම මඟින් ශක්තිය සපයනු ලැබේ. මෙය ඔවුන්ගේ බුද්ධිශෝධනය සඳහා ඉවහල්වනු ඇත.'

*-**උදයානී නවරත්නම්,** යාපනයේ කාන්තා සංවර්ධන නිළධාරී-*

ප්‍රජාවන් විසින් ආගමික උත්සව භාවිත කිරීම හරහා එකිනෙකා අතරට ගමන් කරමින් සාමකාමී සබඳතාවක් ගොඩනඟා ගැනීමට කටයුතු කළ අවස්ථාවන්ට උදාහරණ තිබේ. එවැනි එක් උදාහරණයක් වන්නේ ඇතැම් තෝරාගත් දිනවල හින්දු කෝවිල්වල කොඩි එසවීමට මඩකලපුවේ මුස්ලිම් ප්‍රජාවට ආරාධනා යොමු වීමයි. කෙසේවෙතත්, මෙම භාවිතාවන් ප්‍රජාවන් ද්විත්වය අතරෙහි පිරිහීමට පත්වන්නේ යුද ගැටුම්වලට අදාළ එදිරිවාදිකම් නිසා වන අතර හා මුස්ලිම් ප්‍රජාව අතර දැඩිව ව්‍යාප්ත වූ ආගමික අර්ථනිරූපණවලට අදාළව වෙනත් ප්‍රජාවන් සමඟ මිශ්‍රවීමේ නිදහස ඔවුන්ගෙන් වළක්වාලීමත් සමඟය.

ඇතැම් කාන්තාවන් සඳහන් කර සිටියේ ඉහළ-පහළ රාජ්‍ය ඇරඹුමක් හරහා බලාත්මක කිරීමකට වඩා ප්‍රජාවන්ගේ උත්සාහයන් හරහා ඇරඹුමක් ලෙස ආගම යන්න සංහිඳියාව උදෙසා භාවිත කළ හැකි දෙයක් බවයි.

'මා පෞද්ගලිකව ආගමික නායකයින් ඉහළින් සිතන්නේ නැත. කෙසේවෙතත්, දැඩි කම්පනයට පත් වූ බොහෝ පුද්ගලයන්ගේ රඳා පැවැත්ම හා සුවවීම සඳහා ඔවුන්ගේ ඇදහිල්ල මත යැපෙන බව මම දනිමි. මෙය සඳහන් කරගත යුතු අතර මිනිසුන් එයට කැමති වන්නේ නම් ආගමට සංහිඳියාව තුළ නිසි ස්ථානය ලබා දිය යුතුය.'

*-**ශ්‍රීන් සරූර්,** ක්‍රියාකාරියෙක්-*

## සංහිඳියාව තුළ කාන්තාවන්ගේ භූමිකාව

සංහිඳියාව තුළ කාන්තාව වැදගත් භූමිකාවක් නිරූපණය කලයුතු බව අධ්‍යනයේ සියලු දෙනාම පිළිගත් කාරණයකි. සංහිඳියාව ඉදිරියට ගෙනයාමේ කාන්තාවන්ගේ විශේෂිත දයකත්වය ලෙස කාන්තාවන්ගේ ශක්‍යතාවන් ප්‍රවර්ධනය ඇතැමුන් විසින් ඉස්මතු කළ අතර ඇතැම් ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කර සිටියේ කාන්තාවන්ට එය අයිතියක් ලෙස දායකවීමට හා ස්ත්‍රීන් ජනගණය තුළ සමාන මට්ටමින් ඇතිනිසා සමාන අයිතීන් ලබාදිය යුතු බවයි.

> ‘කාන්තාවන්ට ඉමහත් වූ වේදනා දරා සිටීමට හා ඊට ඉහළින් නැගී සිටීමට හැකියාව ඇත. ඔවුන්ද නායකත්ව චරිත සඳහා රැගෙන යා හැකි කණ්ඩායමකි. සිය ජීවිතයේ සෑම තත්පරයකම කාන්තාවන් සමාජයේ විවිධ භූමිකාවන් නිරූපණය කරති. ඒ හා සමානවම, සංහිඳියා යාන්ත්‍රණයේද ඇයට භූමිකාවක් නිරූපණය කළ හැකිය.’
>
> ***-මල්ලවාරච්චිගේ චතුරානි රසිකා,*** *අධ්‍යක්ෂ, ශක්ති කාන්තා සංවිධානය-*

කාන්තාවන් සංහිඳියා ක්‍රියාදාමයට දායක විය යුතු අතර මන්දයත් උපයන්නන් හා ගෘහ මූලිකව පෝෂණය කරන්නන් ලෙස යන ද්විත්වාකාරයෙන්ම කාන්තාවන් විවිධ ප්‍රතිඵල ඇති කරමින් යුදමය සන්දර්භය තුළ බලපෑමට ලක්වී ඇති බවයි. මෙම අධ්‍යයනය මඟින් අනාවරණය කරනුයේ ‘සෑම ජනකොටසක පුරාම දෛනික පදනම මත මෙම අභියෝගයන් හා හරඹ කරන කාන්තා ගෘහමුලිකයින් බොහෝ ප්‍රමාණයක් සිටින අතර එමඟින් ඔවුන්ගේ අවශ්‍යතා හා දැක්ම සංහිඳියා යාන්ත්‍රණයට ගෙන ඒමේ අවශ්‍යතාවක් ඇති බවයි.

සංහිඳියා ක්‍රියාවලියේදී කාන්තාවන් ඉතා වැදගත් භූමිකාවක් නිරූපණය කරතත් කාන්තාවන්ට ඊට සහභාගී වීමට ඉඩ සළසා දිය හැකි යාන්ත්‍රණයන්ට සම්බන්ධව අසමර්ථ වී තිබේ. නිදසුනක් වශයෙන්, වෙනත් තීරණ ගැනීමේ  භූමිකාවල මෙන්ම සංහිඳියාව තුළ කාන්තාවන්ගේ දායකත්වය පහසුකරණය සඳහා ස්ත්‍රී පුරුෂ සංවේදීභාවය පිළිබඳ මනා අන්තර්ග්‍රහණයක් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය, සමාජීය-ආර්ථික හා දේශපාලනික ක්‍රියාදාමය තුළ පැවතිය යුත්තක් බවයි. ව්‍යූහාත්මක, නෛතික, ප්‍රතිපත්තිමය,දේශපාලනික හා සමාජීය වෙනස්කම් නොමැතිව ඕනෑම සමාජයක සංහිඳියාවේ මුල්ගල සකස් කරන අව්‍යාජ අන්තර්ග්‍රහණය නිර්මාණය කිරීම අපහසු වනු ඇත.

> ‘පළමුව, සංහිඳියාව යනු කුමක්ද හා එය සිදුකරන්නේ කෙසේදැයි ජනතාව දැනුවත් කළ යුතුය. සංහිඳියාව හා සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව මම ප්‍රමාණවත් ලෙස නොදනිමි. වෙනසක් ඇති කිරීමට ආණ්ඩුව සිදුකරන්නේ කුමක්ද යන්න මම නොදනිමි. මම දන්නේ නෑ අප මෙයට සහභගී විය යුතු ආකාරය. මෙම පාරිභාෂිකයන් හා සංකල්ප පිළිබඳව නොදන්නා මම වැනි පුද්ගලයින් සිටින අතර අප වැනි පුද්ගලයන්ගෙන් සංහිඳියාව බලපොරොත්තු වීම යථාර්ථවාදී නොවේ. සංහිඳියාව හා ජාතික සමඟිය ඇති කිරීම සඳහා බිම්මට්ටමේ සිටින ජනතාවට මෙම යාන්ත්‍රණයන් හා සංකල්ප පිළිබඳව දැනුම්දිය දිය යුතුයි.’
>
> *-හිටපු එල්ටීටීඊ සාමාජික දමිළ කාන්තාවක්, උතුරු පළාත-*

> ‘ඔවුන්ගේ කතාන්දර කීමට මිනිසුන්ට ඉඩලබා දිය යුතුය. විශේෂයෙන්ම පීඩාවට පත් වූ කාන්තාවන්ට, ඔවුන්ගේ කතාන්දර කීමටත් ඒවාට සවන්දෙනු ලැබීමටත් අවශ්‍ය වේ. මෙම සියලු කතාන්දරවලට සවන්දීම හා ලේඛනගත කිරීම සඳහා අවකාසය ලබාදිය යුතුය. උපදේශනය හරහා පමණක් නොව කලාව, සංගීතය, ආරක්ෂිත අවකාස යනාදිය හරහාද මෙය සිදුකළ යුතුය.’
>
> ***-වාසුකි ජෙයසන්කර්,*** *මඩකලපුවේ ක්‍රියාකාරිනියක්-*

> ‘යුද්ධයෙන් තම ස්වාමි පුරුෂයන් අහිමි වූ හා එමඟින් තම පවුලේ වගකීම් තමන් මතට පැවරුණු රටපුරා සිටින ගෘහමූලික කාන්තාවන්ගේ විශේෂිත අවශ්‍යතා හා දැක්ම වැනි ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ මුහුණත හා අත්දැකීම් සංහිඳියා යාන්ත්‍රණයක අත්‍යාවශ්‍ය සාධකයක් වේ.’
>
> ***-සොනාලි දයාරත්න,*** *කොළඹ සංවර්ධන වෘත්තියවේදිනියක්-*

සමාජය මත වන පීතෘමූලික බලපෑම් හා නායකත්ව තනතුරුවලට සම්බන්ධවීමට ඇති අවස්ථා කාන්තාවන්ට නොමැතිවීම යන කාරණා කාන්තාවන්ට සංහිඳියා ක්‍රියාවලින්හි අඩු සබඳතාවක් ඇති කිරීමට හේතු වූ කරුණු ලෙස මෙම අධ්‍යයනය  පෙන්වා දේ. සංහිඳියාවට දායක වන සාධකයක් ලෙස අධ්‍යයනය තුළින් හඳුනාගැනුනේ තීරණ ගැනීමේ සියලු මට්ටම්වල විශේෂයෙන්ම ජාතික මට්ටමේ තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ දායකත්වය හඳුනාගෙන ඇත. එබැවින්, සංහිඳියාව සඳහා අත්‍යාවශ්‍ය ක්‍රියාදාමයක් අන්තර්ගත කර නිර්මාණය කිරීමට පොදු ප්‍රතිපත්තිමය කරුණුවලදී කාන්තාවන්ගේ දායකත්වයට බාධා කරන පීතෘමූලික ආකල්පමය අදහස් ආමන්ත්‍රණය කළ යුතුය.

'උතුරු පළාතේ පීතෘ මූලික ව්‍යුහාත්මක සම්මතයන් නිසා ස්ත්‍රීන් සාම්ප්‍රදායික වශයෙන් පුරුෂයන් මත යැපීම පුරුෂයන් උපයන්නන් ලෙස එනම් පෙදරේරුවන් හෝ වඩුකාර්මිකයන් ලෙස සිදුවේ. එය බොහෝ ප්‍රදේශවල තවමත් පවතී. යුද්ධය කෙසේවෙතත්, පුරුෂයන්ගේ විසමානුපාතික ගණන් ලෙස අඩු වීම කාන්තාවන්ගේ ජීවිතයේ ව්‍යාකූලත්වයක් ඇතිකර ඇත්තේ ඔවුන්ට කළ හැකි දේ, ඔවුන් කළ යුතු දේ හා ඔවුන් සිදු කිරීමට සූදානම් විය යුතු දේ පිළිබඳව අපැහැදිලිතාවක් ඇති කරමිණි මෙම සියලු කැලතෙන සමාජ විද්‍යාත්මක කරුණු සැලකිල්ලට නොගැනීම වරදක් වී තිබේ.'

*-**මහලක්ෂ්මී කුරුෂාන්තන්,** දිස්ත්‍රික් සම්බන්ධීකාරක, දමිළ, මන්නාරම-*

ප්‍රතිචාර දක්වූ ඇතැමුන් සඳහන් කළේ ඓතිහාසිකව කාන්තාවන් සාමය ඇතිකරන්නන් ලෙස භූමිකාවක් ඉටු කර ඇති අතර එය සංහිඳියා සන්දර්භයක් තුළ උරමත පැටවෙන විශාල බරක් වනු ඇති බවයි. සාමය ගොඩනැගීමට ඔවුන් හා සමානවම වැදගත් භූමිකාවක් කාන්තාවන්ටද නිරූපණය කිරීමට තිබෙන බව පුරුෂයන් විසින් අත්‍යාවශ්‍යයෙන්ම වටහාගත යුත්තක් බවද අවධාරණය කෙරිණි.

'සංහිඳියා ක්‍රියාවලිය තුළ කාන්තාවන්ට දැඩි භූමිකාවක් නිරූපණය කිරීමට තිබේ. සියලු ප්‍රජාවන්වල කාන්තාවන් දුකට පත්කරමින් යුද්ධය බලපෑ ආකාරයට ශ්‍රී ලංකාව උදාහරණයක් වේ. එබැවින් සංහිඳියා ක්‍රියාදාමය තුළ කාන්තාවන් ඇතුළත්කරගැනීම වැදගත් වේ.'

*-**ආචාර්ය ෆසීහා අස්මි,** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය-*

## සංහිඳියාව ළඟා කරගැනීමට/අභියෝග යන් පිළිබඳව විසඳිය යුතු කාන්තාවන්ගේ ගැටලු

කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හිංසනයට අදාළ ගැටලු ඉක්මණින් විසඳීමට අත්‍යාවශ්‍ය වේ. යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් කාර්යක්ෂම කළ යුතුය. ඒ අනුව, කාන්තා අභිමනය හා අයිතිවාසිකම් අපයෝජනය කරනු ලබන ආකාරය හා ඒවාට විසඳුම් ලබාදීම සඳහා විවිධ ක්‍රම අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ. එවැනි ව්‍යුහාත්මක හා සමාජීය වෙනස්කම් සාමය හා සංහිඳියාව පිළිබඳ පූර්ව අවශ්‍යතාවන් වේ. එපමණක් නොව, කාන්තාවන්ට බලපාන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම් සම්බන්ධයෙන් කාන්තාවන් සහභාගී විය යුතු අතර කාන්තාවන්ට අනන්‍ය හා ප්‍රමුඛ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී පුරුෂයන් එහි බහුතර පාර්ශ්වකරුවන් වීම වැළැක්විය යුතුය.

කාන්තාවන්ට වෙනස්කම් සිදුකරන ආකාරයෙන් වන ශ්‍රී ලංකාවේ විශේෂ නීතිවල බොහෝ ප්‍රතිපාදන සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. එබැවින්, තේසවලාමේ හා මුස්ලිම් නීතිය වැනි කාන්තාවන්ට වෙනස්කොට සැලකීම් සිදුකරන ප්‍රතිපාදන අන්තරගතවන නීතීන් අත්‍යාවශ්‍යෙන්ම සංශෝධනය කළ යුතුය. ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් වැළැක්වීමට වන මෙම ප්‍රජාවන්ගේ පුරුෂයන් මැදිහත්වීම අධෛර්යමත් කිරීමට රජය කටයුතු කළ යුත්තේ එම සංශෝධනවලින් පෙම පුරුෂයන්ගේ ප්‍රතිලාභී තත්වයට බලපෑමක් වන නිසාය.

'අතුරුදහන් වීම් නිසා බොහෝ කාන්තාවන් දැන් තනිවම සිටී ඉඩම් හෝ අයිතිවාසිකම් සම්බන්ධව කිසිඳු හිමිකමක් ඔවුන්ට නොමැත. ඇතැම් (දමිළ) කාන්තාවන්ට ණයමුදල් පවා ලබාගත නොහැකිය. සිංහල ප්‍රජාව මෙන් නොව දමිළ කාන්තාවන්ට ඉඩම් පිළිබඳ හිමිකමට ප්‍රවේශයක් නොමැත්තේ ඔවුන්ට බලපාන විශේෂ නීතීන්හි ප්‍රතිපාදන නිසාය.'

*-**රණවීර මුදියන්සේලාගේ තක්ෂලා,** කාන්තා සංවර්ධන නිළධාරී-*

සංක්‍රාන්තික යුක්තියේ යාන්ත්‍රණයන් හරහා යුද්ධයෙන් අතුරුදහන් වූවන්ගේ මව්වරුන් හා බිරින්දෑවරුන් විසින් බලාපොරොත්තුවන ප්‍රතිකර්ම රාජ්‍ය විසින් ලබාදිය යුතුය. ඔවුන් ඉල්ලා සිටින වන්දි ගෙවීමේ ස්වභාවය පිළිබඳව සොයාබැලීම සඳහා කාන්තාවන්ගෙන් විමසිය යුතුය. විශේෂයෙන්ම පවුල් නැවත එක්කල නොහැකි අවස්ථාවලදී ප්‍රමාණවත් වන්දියක් ලබාදිය යුතුය.

සංහිඳියා ක්‍රියාවලියට බාධාවන කාන්තාවන්ගේ ගැටලු පිළිබඳව දැනුවත් කිරීම හා තොරතුරු බෙදාහැරීම සඳහා මාධ්‍ය යොදාගත හැකිය. මහජනතාවගේ අවබෝධය වෙනස් කිරීමට හා මහජන විඥානය තුළ වෙනසක් ඇතිකිරීම සඳහා මාධ්‍ය යොදාගත හැකිය. ධනාත්මකව සිවිල් ව්‍යාපාර ඉදිරියට වෙනස් කිරීම සඳහා මෙය දායක විය හැකිය.

තීරණ ගැනීමේ සෑම මට්ටමකදීම කාන්තා නියෝජනය වැඩිකිරීම අත්‍යාවශ්‍ය වන්නකි. මේ සඳහා නායකයින් දැනුවත් කිරීම හා කාන්තාවන්ගේ ගැටලුවලට විසඳුම් ලබාදීමද අවශ්‍ය වේ.

මූලික මානව අවශ්‍යතා තෘප්තිමත් කිරීමට නොහැකිවීම සෘණාත්මකව සංහිඳියාවට බලපෑම්

කිරීම නිසා ජනජීවිතයට හා රැකියාවට අදාළව ආහාර සුරක්ෂිතතාවක් හා තිරසරබවක් නිර්මාණය කිරීම අත්‍යාවශ්‍ය වේ.

රාජ්‍ය නිලධාරීන්, ප්‍රජාමූල සංවිධාන හා සිවිල් සමාජ ක්‍රියාකාරීන් වැනි පුළුල් ජාලයක මිනිසුන් සමඟ සම්බන්ධ වීම හා ජාලගතවීමට අවශ්‍ය ප්‍රවේශය සළසා දීමද අත්‍යාවශ්‍ය වේ. මෙම ස්ථරයන් අතර සම්බන්ධතාවය අවධාරණය කරනුයේ එක්කෝ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් බිම්මට්ටමේ සිටින්නන්ගේ යථාර්ථයන් අවබෝධකරගැනීම හා විශේෂයෙන්ම ප්‍රතිපත්ති මට්ටමේ තීරණවල ප්‍රතිලාභ බිම්මට්ටමේදී ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිවීම සහතික වීමයි. එම සබඳතා වැඩිදියුණු කිරීම හා වර්ධනය කිරීම ඉහළ මට්ටමේ පාලන ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමෙන් එහි ප්‍රතිලාභ පහළ මට්ටමේ සිටින්නන් වෙත පාලනය හරහා ලැබීම සහතික විය යුතුය.

ග්‍රාමීය සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති වැනි ගම් පදනම් කරගත් සංවිධාන විනිවිදභාවය සහිතවය. එම ආයතනවල සේවාවන් අවශ්‍යවන කාන්තාවන්ට ප්‍රවේශය ලබාදීම පහසු කළ යුතුය. පුරුෂ අවශ්‍යතා, ඉල්ලීම් හා දුක්ගැනවිලි සැබෑ ලෙසම ඉටුකිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිති ස්ථාපිත කර නොතිබුණද, සැබෑ පරිචය තුළ එම ආයතන කාන්තා සහභාගීත්වය බැහැර කරයි. මීට වෙනමම කාන්ත ග්‍රාමීය සංවර්ධන සමිති ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. මෙය විසඳාගත යුතු අතර කාන්තාවන්ට හා පුරුෂයන්ට සමානව සහභාගී විය හැකි අවස්ථාවන් ලබාදිය යුතු අතර එහිදී අවස්ථා ලබානොදීමට වන තත්වයන් පිළිබඳ වඩාත් වෙනස් වූ හා දැඩි වූත් දැක්ම හා අවබෝධයකින් අදහස් හුවමාරු කරගත යුතුය.

කාන්තාවන්ට ඔවුන්ගේ දුක්ගැනවිලි පිළිබඳව නියෝජනය කිරීමට ප්‍රාදේශීය දේශපාලනඥයින්ට ප්‍රවේශය ලබා දිය යුතුය.

කාන්තාවන්ට ආරක්ෂාව හා ආරක්ෂාව පිළිබඳව වන හැඟීම භුක්තිවිඳීමට අවස්ථාව ලබාදිය යුතුය.

## සංහිඳියාව තුළ කාන්තා නායකත්වය

සමාජයේ සියලුම මට්ටම්වල කාන්තාවන්ගේ නායකත්වය ඇතිබවට සහතික වීම අවශ්‍ය වේ. සමාන වැඩසඳහා සමාන වැටුපක් කාන්තාවන්ට ලැබීම පිළිබඳව සහතික වීමට වෘත්තිය සමිතිවල කාන්තා නායකත්වය අවශ්‍ය වේ. කාන්තා නායකත්වය වැඩිදියුණු කිරීම සඳහා සමාන රැකියා අවස්ථා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවය තිබීම කාන්තා නායකත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ. මෙම ප්‍රදේශයන්හි වැඩිදියුණු කිරීම් සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේදී කාන්තාවන් ඉටුකරන කාර්යභාරයට දායක විය හැකිය.

අධ්‍යනයේ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළේ ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රථම කාන්තා අග්‍රාමාත්‍ය ධූරය දැරූ රටක් වුවද ශ්‍රී ලංකා පුරුෂ කේන්ද්‍රීයව හා පීතෘ මූලිකව සිතන බවයි.

‘ඓතිහාසිකව, නායකත්ව හැකියාවන් සහිත අවස්ථාවන් කාන්තාවන්ට අහිමි කර තිබේ. ඒ හා සමානව, කාන්තාවන්ට අවස්ථාවක් ලබාදුන් අවස්ථාවලදී ඔවුන් සුවිශේෂී නායකයින් බවට පත්ව ඇත. කාන්තාවන් නායකත්ව තනතුරු භාරගැනීමට අකමැත්තක් දක්වන බව පොදු චෝදනාවකි. කාන්තාවන් සවිබල ගැන්වීම හා නායකත්වයේ බලය තහවුරු කරගැනීම පහසු බව මට සිතේ. දුෂ්කර වන්නේ පීතෘ මූලික පද්ධතියක කාන්තා නායකත්වයේ පැවැත්ම අපහසු වීමයි. මිනිසුන් කෙතරම් විවෘතද, කාන්තාවන්ද ඇතුළතුව තමන්ගේ නායකයන් ලෙස කාන්තාවන් පිළිගැනීමට? හවුල් නායකයන් වන විට එනම්, කාන්තාවක් හා පුරුෂයෙක් ඉළධාරීන්ට කතා කරන විට මා සොයාගත්තේ පුරුෂ නායකයා ඇමතීමට හා කතා කිරීමට ලක්කර ඇති බවයි. කාන්තා නායකත්වය ශක්තිමත් කිරීම සඳහා පුහුණුව, අවස්ථාවන් හා සුදුසු පරිසරය යන්න අත්‍යාවශ්‍ය වේ.’

*-**මෙනාහා කන්දසාමී,** වෘත්තිය සමිති සාමාජිකාවක්, කම්කරුවන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් නීතිඥ-*

පශ්චාත් යුද සන්දර්භය තුළදී, සිය ගෘහමූලිකත්වය හා ග්‍රාමය කළමණාකරණය කරගනිමින් නායකත්වයේ වැදගත් භූමිකාවක් කාන්තාවන් විසින් නිරූපණය කළබව ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදි. සමහරෙක් සඳහන් කළේ කාන්තාවන්ගේ මෙම ක්‍රියාකාරීත්වය ඔවුන්ගේ ශක්‍යතාවන් පිළිඹිබු කරන බවට ඇඟවීමක් කරන බවයි.

කාන්තා නායකත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පාර්ලිමේන්තු මට්ටමේ කාන්තා නියෝජනය වැඩිකළ යුතුබව තවත් සමහරුන් සඳහන් කරන ලදි. කාන්තා නායකත්වය පළාත් පාලන මට්ටමින් හා සමාජයේ සියලු තීරණ ගැනීමේ මට්ටම්වල වැඩිදියුණු කළ යුතුය.

'කාන්තාවකගේ යහපැවැත්මට හානිකර වන සංකල්පයන්, සේවා සඳහා ඔවුන්ගේ ප්‍රවේශය හා ඇය දෙස වෙනස් දෘෂ්ටියකින් බැලීමට සමාජයට උපදෙස් දීම හරහා සීමා කර ඇත. 'කාන්තාව' පිළිබඳ සංකල්පය සමාජීය එකකි. කාන්තාව සමාජයේ ද්විතියික තත්වයට පත් නොකර ඇයට සම අයිතිවාසිකම් ලබා දිය යුතුයි අප මෙම දුර්මතයන්ගෙන් හා විලංගුවලින් නිදහස් විය යුතුය.'

**-නිර්ති තනූජා,** *ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරිනියක්-*

කාන්තාවන්ට මනා පුහුණුවක් හා ශක්‍යතා වර්ධනය කිරීමක් සංහිඳියා ක්‍රියාදාමයට විධිමත්ව දායකවීම සදහා අවශ්‍ය බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් යෝජනා කර සිටින ලදි.

කාන්තාවන් නායකත්වයට පත්වන ගෘහ ඒකකවල අවශ්‍යතා සපුරාලීමට ස්ථිර විසඳුම් අවශ්‍ය බව ඇතැමුන් සඳහන් කරන ලදී සංහිඳියා ක්‍රියාදාමය තුළ කාන්තා නායකත්ව කාර්යභාරය වැඩිදියුණු කිරීම සඳහා ගෘහ මූලික කාන්තාවන්ට ආධාර සැපයීම අත්‍යාවශ්‍ය වේ

සංහිඳියාවේ විවිධ ක්ෂේත්‍රවලට අදාළව නායකත්ව කාර්යභාරයන් සිදුකිරීමට කාන්තාවන්ට හැකිය. සංහිඳියා කටයුතුවලදී කාන්තාවන් සිය පවුල තුළ හා ඉන් පිටත ප්‍රජා මට්ටමේ, ග්‍රාමීය මට්ටමේ හා ජාතික මට්ටමේ නායකත්වයක් දරන බවට සාක්ෂි දරයි.

'පසුගිය වසර දෙක තුන කාලය ඇතුළත මම ජාතික සාම මණ්ඩලයේ පාර්ශ්වකරුවෙකි. යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවල සිටින කාන්තාවන් සඳහා බොහෝ මැදිහත්වීමේ වැඩසටහන් මම සංවිධානය කළෙමි. මීට අමතරව, මම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අතිශය නායකත්ව කුසලතා සහිත කාන්තාවන් තෝරාගෙන තවදුරටත් සංහිඳියා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ජාලයක් සකස් කරන ලදි.'

**-මල්ලවාරච්චිගේ චතුරානි රසිකා,** *අධ්‍යක්ෂ, ශක්ති කාන්තා සංවිධානය-*

## කාන්තාවන්ට අවශ්‍ය කුමක්ද : රජයට හා සිවිල් සංවිධාන වෙත නිර්දේශ

අධ්‍යයනය ට ප්‍රතිචාර දැක්වූවන් පොදු ආඛ්‍යානයක අවශ්‍යතාවය අවධාරණය කරන ලදි. ගැටුම්වල බලපෑම පිළිබඳව දැක්වෙන කතාන්දරය නිරූපණය කිරීම හා එවැනි ගැටුම්වලින් එක් එක් ප්‍රජාවන් බලපෑමට ලක්වූ ආකාරය අනාවරණය කිරීම ඉන් අපේක්ෂිතය. සියලු ප්‍රජාවන්ට දැනෙන අත්දැකීම් හා ශෝකය පිළිබඳ සමානකම අවධාරණය කිරීමට එවැනි ආඛ්‍යානයකට හැකි විය යුතුය. එවැනි ප්‍රවේශයක් වෙනස්කම්වලට වඩා සමානකම්වලින් යුත් කාචයන් හරහා සංහිඳියාව බැලීම සඳහා ක්‍රමවේදයක් සකස්කරනු ඇත.

පොදු ආඛ්‍යානයට තනි පුද්ගල හා සාමූහික ආඛ්‍යානයන් යන ද්විත්වයෙන්ම සමන්විත විය යුතුය. සංහිඳියාව පිළිබඳ පොදු ආඛ්‍යානයට සංහිඳියාවට සහය දක්වන ආගමික මතවාද අන්තර්ගතකිරීම පිළිබඳව ධනාත්මක ආකල්ප ඇතැමුන් විසින් දරන ලදි.

අධ්‍යයනය සඳහා සහභාගී වූ කාන්තාවන් ඉස්මතු කර සිටියේ අපක්ෂපාති හා කාර්යක්ෂම රාජ්‍ය සේවය/සේවාවන් හි අවශ්‍යතාවය වැදගත් බවයි. රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්, රාජ්‍ය යාන්ත්‍රණය මඟින් සමාජයේ බොහෝමයක් සමාජ-දේශපාලන ස්ථරයන් නියෝජනය කළයුතු බවත් සඳහන් කරන ලදි.

ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ රජයට හඳුන්වා දියයුතු බවට දක්වන ලදී පහතින් දැක්වෙනුයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහතික කිරීමට අවශ්‍ය වන දෑය:

i) විධායකය, ව්‍යවස්ථාදයක හා අධිකරණය අතර දැඩි ලෙස බලය තුළනය කිරීම;

ii) නීතියේ ආධිපත්‍ය හා මානව හිමිකම් පිළිබඳ වැඩපිළිවෙළක් ස්ථාපිත කිරීම;

iii) පොදු කටයුතුවලදී පුරවැසි සහභාගීත්වය වැඩිදියුණු කිරීම;

iv) සිවිල් වගකීම වැඩිදියුණු කිරීම;

v) රටේ දීර්ඝකාලීන අවශ්‍යතා පිළිබඳ සැළකිලිමත්වීමට දේශපාලන ක්‍රියාකාරීන් දිරිමත් කිරීම;

v) වටිනාකම්, අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ යුක්තිය, සැමට අභිමානය මත පදනම් වන සමාජයකට වරප්‍රසාද හා අනුග්‍රහ දැක්වීම්වලින් වියුක්ත පද්ධතියක් මඟින් සමාජය පරිවර්තනය කිරීම.

සංහිඳියා ක්‍රියාවලිය අව්‍යාජව ළඟා කරගැනීමට පළාත් සභා හා ආණ්ඩුව විසින් ඒ අතර බලය හුවමාරුකර ගැනීමක් සහතික කිරීම පවත්වාගැනීමට 'බලය බෙදාහැරීමක්' විය යුතුබව සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූවන් සඳහන් කරන ලදි.

සංහිඳියාවට දායකයවීමේ සාධකයක් ලෙස සම්මුඛ සාකච්ඡාවට බඳුන්වූවන් විසින් සෑම තීරණ ගැනීමේ

මට්ටම්වලදීම කාන්තා සහභාගීත්වය නිරන්තරයෙන් සළකනු ලැබ ඇති බවයි සංහිඳියා ක්‍රියාවලියට බලපා ඇති ප්‍රාථමික අවශ්‍යතාවන් ලෙස පාර්ලිමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල 25%ක අවම කාන්තා නියෝජනයකට වන කෝටාව වර්ධනය කර ඇත. මේ සම්බන්ධයෙන්, කාන්තාවන්ට දේශපාලනික වශයෙන් සක්‍රීයව රැඳී සිටීමට බාධා කරන අවහිරතාවන් ඉවත් කිරීම අත්‍යාවශ්‍ය බවද සඳහන් විය.

ශ්‍රී ලංකා ජනගහණයෙන් 50%ට වඩා කාන්තාවන් වේ. එබැවින්, නියෝජනය හා තීරණ ගැනීමේ යන මට්ටම් ද්විත්වයේදීම සෑම ක්‍රියාවකම 50%ක සමන්විතයක් කාන්තාවන්ට තිබිය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය හා සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය හරහා සෑම මට්ටමකම කාන්තාවන්ගේ නියෝජනය විවෘතව පැවතිය යුතුය.

වර්තමානයේදී, සංහිඳියාව සඳහා විවෘතව ඇති නෛතික යාන්ත්‍රණ බිඳීමකට ලක්ව ඇති අතරම සමාජයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාන්තාවන් අන්තර්ග්‍රහණය කිරීමද නොසළකා හැරීමට ලක්ව ඇත. එබැවින් නෛතික යාන්ත්‍රණ පහසුකිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, නීතිය ප්‍රතිසංස්කරණය කළ යුතු අතර සංශෝධිත නීති ඵලදායී. ලෙස ක්‍රියාත්මක කිරීමට රජය පියවර ගත යුතුය. එවැනි ප්‍රතිසංස්කරණය කළ නීති ක්‍රියාත්මක කිරීමේදී බිම් මට්ටම ඇතුළු සමස්ත සමාජයටම අර්ථාන්විත හා ධනාත්මක බලපෑමක් සිදුකළ යුතුය.

සංහිඳියාව සහතික කිරීම සඳහා සමාජයේ සියලුම ක්‍රියාදාමයන්හි සෑම අංශයක්ම ඇතුළත් කළ යුතුය. එබැවින් නියෝජනය යන්න සුළුතරය හා අඩු වරප්‍රසාදිත ප්‍රජාවන් සඳහා සහතික කළ යුතුය. එවැනි කණ්ඩායම්වල හඬ නැගීම හා ඔවුන්ගේ සළකා බැලීම් සංහිඳියා යාන්ත්‍රණයට ඇතුළත් කිරීමද අවශ්‍ය වේ.

සංහිඳියාව පිළිබඳව ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාවන් තුළ දැනුවත්භාවය ඇති කළ යුතුය. මේ සඳහා ප්‍රජාවන් අතර අන්තර් ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීම අවශ්‍ය වේ. අධ්‍යයනය තුළ යෝජනා වූ යාන්ත්‍රණයන්ගෙන් එකක් වූයේ, විවිධ ප්‍රජාවන්හි සාමාජිකයින් අතර සාමකාමී සබඳතාවය ප්‍රවර්ධනයට යාන්ත්‍රණයක් ඇරඹීමක් ලෙස විවිධ විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය ප්‍රජාව අතර සබඳතාවක් ඇති කිරීමයි. බහුවාර්ගික සියලුම පාසල්වල අන්තර්වාර්ගික සාමය තවදුරටත් ප්‍රවර්ධනයට හා නියාමනයා කටයුතු කළ හැකි අතර එමඟින් තරුණ පරම්පරාව සඳහා වසර ආරම්භයේ සිට එකිනෙකාගෙන් එකිනෙකාට මැදිහත්වීමට අවස්ථාවක් ලබා දේ.

'ඊළඟ පරම්පරාව සමඟ ඒකාබද්ධ කිරීම ආරම්භ කිරීම එකසේ වැදගත් වේ. වාර්ගික විවිධතාවන්ට අනිවාර්යෙන්ම එය නොසළකා කටයුතු කිරීමට දරුවන් හා තරුණයන් අනිවාර්යෙන්ම ගෙන ආ යුතුය. ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපේ පොදු අනන්‍යතාවය අපගේ ශක්තියයි. වැදගත්ම දේ වුවද, අද බොහෝවිට කාගාටුවට කරුණක් නම්, ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ තැකීමකින් තොරව තමන්ගේ විවිධත්වය පිළිබඳ අභිමාන වීමයි.'

***-නීතිඥ අනූෂා ඇලස්-***

තවද, විවිධ වාර්ගික, ජනවාර්ගික, භාෂාමය, ආගමික, සමාජ-දේශපාලනමය, අධ්‍යාපන පසුබිමක් සහිත ජනතාව අවබෝධ කරගැනීමේ අවස්ථාවක් ලබාදීම සඳහා සිය ප්‍රජාවන්ගේ ප්‍රතිරාව නංවන ස්ථානවලින්



මිනිසුන්ව ඉවත්කිරීමේ දැක්ම සමඟ රජයේ නිළධාරීන් විවිධ ප්‍රදේශවලට යෙදවිය යුතුය.

> 'ජාතික සමගිය' යන වචනය පිළිබඳව සැකයක් මාහට තිබේ. මා සිතන්නේ විවිධත්වය තුළ ජීවත්වන මිනිසා අන්‍යන්ගේ ප්‍රජාවන් හා භාෂාවන් පිළිගනිමින් හා තවකෙකු සිය සංස්කෘතියට දමා ගැනීමෙන් තොරව උචිත ලෙස ජීවත්වීම සඳහා තමන්ගේම මාර්ග සොයාගැනීමයි.'
>
> ***-මහාචාර්ය සිට්‍රාලේගා මෞනගුරු,*** *විශ්‍රාමික විශ්වවිද්‍යාල කථිකාචාර්ය-*

ආණ්ඩුවේ වැඩපිළිවෙලින් සහන බලාපොරොත්තු වන කාන්තා වින්දිතයින්ට හා යැපෙන්නන්ට සේවාවන් සඳහා ප්‍රවේශවීම ප්‍රවර්ධනය කිරීමේ අදහසින් විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ කාන්තා නිළධාරිනියන් ගණන වැඩිකළ යුතුය.

වන්දි ලබාදීම අවශ්‍යවන තැන්වල හා අතීත වැරදි සිහිපත් කිරීමට යාන්ත්‍රණයක් රාජ්‍ය විසින් ඇතිකළ යුතුය.

අධ්‍යයනයේ නියැලුණු ඇත්තැම් කාන්තාවන් සඳහන් කළේ ගැටුම්වලදී වින්දිතයින් බවට පත්වූවන් චිකිත්සාවට යොමුකිරීම ප්‍රයෝජනවත් බවයි. ගැටුම මඟින් බලපෑමට ලක්වූවන්ගේ කතාන්දර කලාව හා වෙනත් ප්‍රකාශ කිරීමේ මාර්ග හරහා වාර්තා කළ හැකි බවටද යෝජනා විය.

> 'දරුවන් වැඩිහිටිවන ලෙස ඔවුන්ට හුදෙක් ජීවත්වීමට පමණක් නොව, සටන්කාමීන් විසින් බලහත්කාරයෙන් අත් අඩංගුවට ගැනීමෙන් හෝ බලහත්කාරයෙන් බඳවාගැනීමෙන් ආරක්ෂා කිරීම බිය ඇතිකරන්න සලකාබැලීමක් බවට පත්ව ඇත. එල්ටීටීය බලහත්කාරයෙන් මාගේ දරුවන් ඊට බඳවාගන්නා තුරු මම මගේ දරුවන් හොඳින් රැකබලා සිටියෙමි. ඔවුන් සියල්ලම අද ස්තුතිවන්ත වන අතර විශේෂයෙන්ම බලෙන් බඳවාගතවුන්ගෙන් ඇතැමුන් කම්පනයට පත්ව සිටිති. මේ පුතාට සිය පාදයෙන් කොටසක් නොමැති අතර ඔහු ඇවිදින්නේ නොන්ඩි ගසමිනි. ඔවුන් සියල්ලගේම (දියණියන් දෙදෙනෙකු හා පුතුන් හතරදෙනෙකු) සිය ශරීරවල තවමත් උණ්ඩ සළකුණු ඇති අතර මෙය වසර ගණනාවක් පුරා ඔවුන්ට මානසික සංකූලතාවන්ට ලක්ව තිබේ.'
>
> ***-මාග්‍රට් කෘෘස්,*** *හිටපු අභ්‍යන්තර අවතැන් වූවෙක්/ස්වේච්ඡා සමාජ සේවිකාවක්, මන්නාරම-*



අතීතයේ යථාර්ථයන් පිළිගැනීම සංහිඳියාවේ වැදගත් අංගයකි. ඒ අනුව, ශ්‍රී ලාංකික සන්දර්භය තුළ අනුස්මරණය කිරීමේ දිනයක් හරහා මතකයට නැගීම වැනි ජාතික දිනයක් සංහිඳියාව නැංවීම සඳහා ප්‍රයෝජනවත් විය හැකිබවට ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස විය.

යුද්ධය අතරතුර සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳ අව්‍යාජ ආඛ්‍යානයක සම්පූර්ණතාවය දකුණේ සිටින ජනතාව අතර බෙදාහැරීම මඟින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සිටි ජනතාවගේ අත්දැකීම් වටහා ගැනීමට හේතුවනු ඇතිබව ප්‍රතිචාර දැක්වූවන් දක්වා සිටින ලදි. අනෙක් අතට, දකුණේ ජනතාව ඔවුන් මුහුණ දුන් ඛේදජනක කුරිරුකම් පිළිබඳ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ජනතාවද දැනුවත් විය යුතුය. එවැනි යාන්ත්‍රණ මඟින්, විවිධ වූ අත්දැකීම්වලින් එහා ගිය සමාන අත්දැකීම් අවධාරණය කිරීමේ හැකියාවක් ඇත.

අධ්‍යනයේ ප්‍රතිචාර දැක්වූවන් තවදුරටත් සඳහන් කර සිටියේ සත්‍ය, යුක්තිය, වන්දි ගෙවීම හා යළි ඇතිනොවීම සහතික වීම වැනි සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් ස්ථාපිත කළයුතු බවයි. සංහිඳියාව සාර්ථකව අත්කරගැනීම සඳහා මෙම සහතික කිරීම් අත්‍යාවශ්‍ය වේ.



සමාජය, තීරණ ගනු ලබන්නන් හා දේශපාලන ක්‍රියාකාරීන් දූෂණය හා වෙනස්කොට සැළකීම සිදු නොකළ යුතුය.

සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේදී ස්වාධීන කාන්තා කොමිසමක් ස්ථාපිත කිරීම ප්‍රයෝජනවත් වනු ඇතිබව ඇතැම් කාන්තාවන්ගේ අදහසයි.

සාර්ථක සංහිඳියාවක් සඳහා කාන්තා දායකත්වය හඳුනාගැනීම හා වන්දි ලබාදීම අවශ්‍ය වේ. මේ අතර, කාන්තාවන්ගේ නොගෙවූ ශ්‍රමය සඳහා වටිනාකම් අගය කිරීම අවශ්‍ය වේ. සමාජ ආරක්ෂණමය ව්‍යූහයක (යුද්ධයෙන් බලපෑමට පත්වූ කාන්තාවන්ට ප්‍රමුඛ වශයෙන්) අවශ්‍යතාව ඔවුන්ගේ ජීවිතවල ස්ථිරසාරත්වය හා අභිමානය සහතික කරයි.

'සංහිඳියාව යනු හැඟීම් හා මනෝ ව්‍යායාමයක් වන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්න ඊට අදාළ සුළු දෙයක් වේ. පිළිගත යුතු හා ප්‍රශංසනීය විය යුත්තේ ශ්‍රී ලාංකිකයෙකු වීමේ අදහසයි. මෙම අතිවිශිෂ්ඨත්වය අපගේ වෙනස්කම්වලට වඩා වැඩියෙන් සැමරිය යුතුය. උතුර හා දකුණ අතර විශ්වාසය ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාව තුළ සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳව මම සළකා බලමි. බොහෝ කාලයක් පුරා පැවතුණු ගැටගැසුණු අවබෝධයන් හා යුද්ධයත් සමඟ වෙනස් වී සංයුක්ත වී තිබේ. මේ සඳහා අන්තර්ක්‍රියා හා සංවාදයන් අත්‍යාවශ්‍ය වේ. විවිධාකාර වූ පුද්ගලයින් සමඟ සම්බන්ධවීමට උත්සාහ කිරීම අප සියලු දෙනාටම අනිවාර්යෙන්ම, වෙනස්කම්වලට වඩා වැඩි සමානකම් ඇතිබව තේරුම්ගත හැකිවනු ඇත.'

***-දරීශා බැස්ටියන්ස්,*** *ජනමාධ්‍යවේදිනියක්-*

අන්තර්වාර්ගික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමට රජය පියවර ගත යුතුය. සාමය වැඩිදියුණු කිරීම සඳහා වෙනම නීති සකස් කළ යුතුය. පශ්චාත් අරගල සන්දර්භයත් සමඟ සාර්ථක ලෙස කටයුතු කළ රටවලින් හොඳම භාවිතයන් ඇතුළත් කරගැනීම හරහා එක සාක්ෂාත් කරගත හැකිය.

සංහිඳියා ක්‍රියාවලිය සඳහා කැපවූ රජයේ වෙබ් අඩවියක් දියත්කිරීම හා පවත්වාගැනීමද අත්‍යාවශ්‍ය වේ. සාමකාමී සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන විනිවිදභාවය පවත්වාගැනීමෙන් එවන් පියවරක්ද සමාජයට ප්‍රචණ්ඩත්වය අවුලුවාලන දූෂිත ක්‍රමවේදයන් වළක්වාගැනීමටද අත්‍යාවශ්‍ය වේ.

යෞවන කටයුතු, යුක්තිය ඉටුකිරීම හා රාජ්‍ය භාෂා ද්විත්වයම අධ්‍යයනය කිරීමට ජනතාවට පහසුකම් සපයන යාන්ත්‍රණයක් රජය ඇති කිරීම හා සන්ධාන භාෂාවද සංහිඳියා යාන්ත්‍රණයේ ආධාරකයක් වන බව බොහෝ කාන්තාවන් දක්වා සිටින ලදි.

'මා සිතන්නේ ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව ඇතිකළ හැකි බවයි. කෙසේවෙතත් එය දීර්ඝ හා අපහසු මාර්ගයකි. භාෂාව දැවැන්ත බාධකයක් වන අතර එය සැමවිටම පවතී. අන්තර්වාර්ගික සබඳතාවලට විශේෂයෙන්ම සිංහල දෙමළ අන්තර් ක්‍රියාකාරීත්වය නිසා භාෂා බෙදීම් හේතුවෙන් විශාල හානියක් සිදුව තිබේ.'

***-ජුවාරියා මොහිදීන්,*** *විධායක අධ්‍යක්ෂ, කාන්තා සංවර්ධන භාරය-*

සමස්ත ශ්‍රී ලාංකික පුරවැසියන්ටම සම අයිතිවාසිකම් සුරැකීම සංහිඳියාව ඇතිකිරීමට විධිමත්ව දායක වන බව මෙම අධ්‍යනයෙන් වැඩිදුරටත් පෙන්වා දේ.

## සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යට කළ හැක්කේ කුමක්ද?

සංක්‍රාන්තික යුක්තියේ ගැටලුවලට රජය විසින් විධිමත් විසඳුම් සෙවිය යුතුය. මේ ආකාරයෙන්, සෑම ජනකොටසකම කාන්තාවන් විවිධාකාරයෙන් පීඩාවට පත් වූ බවත් ඒ සඳහා ඉල්ලා සිටින විධිවිධාන සැලසීමටත් රජය කටයුතු කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් කාන්තාවන් හා ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුය.

රාජ්‍ය ආයතන ස්වාධීන, කාර්යක්ෂම, අපක්ෂපාත. හා විනිවිදභාවයකින් යුතු බවට වගබලාගත යුතුය. රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීම මඟින් පුරවැසියන්ට ප්‍රතිචාර දැක්වීම, වගවීම සහතික කිරීමට හා ප්‍රචණ්ඩත්වය නැවත ඇතිවීම වැලැක්වීම සිදුකළ හැකිය.

> 'සාමය ගොඩනැගීමේ ප්‍රධාන සංරචකයන් වනුයේ විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණමය වශයෙන් රාජ්‍ය ආයතනවල සියලුම පුරවැසියන්ට ප්‍රතිචාර දැක්වීම හා වගකීම දරනු පිණිස රාජ්‍ය ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීමයි. සමාජයේ සෑම අංශයකම පුරවැසියන්ට රාජ්‍යයේ ශක්‍යතාව හා ඔවුන්ගේ දෛනික ගැටලු විසඳීමේ හා වන්දිගෙවීමේ හැකියාව තිබෙන බවට විශ්වාසයක් ගොඩනැගිය යුතුය.'
>
> ***-සොනාලි දයාරත්න,*** *සංවර්ධන වෘත්තීයවේදිනි, කොළඹ-*

රාජ්‍ය විසින් කාන්තාවන්ගේ ආදායම් ස්ථාවරත්වය සඳහා පහසුකම් සැපයිය යුතුය. රැකියා ස්ථානයේ වෙනකොට සැලකීම් තුරන් කිරීම හා කාන්තාවන්ට ස්ථාවර ජීවනෝපායක් සැපයීමද කළ යුතුය. සමාජීය වශයෙන් වන අවදානමට ලක්විය හැකිභාවයට අදාළව කාන්තාවන් මුහුණ දෙන පොදු ප්‍රශ්න හා රැකියාවේ හා ජීවනෝපායේ මෙන්ම ආහාර සුරක්ෂිතභාවය හා තිසරභාවය පිළිබඳවද නිසි සැපයුමක් ඔවුන්ට ලබාදිය යුතුය.

> 'ගැටුම් මඟින් කාන්තාවන් අහිතකර ලෙස බලපෑමට ලක් වේ. ඔවුන්ගේ අවධානම වැඩිවන අතර මෙම අවධානම සුරාකෑමට ලක්වන අන්තර් සබඳතා ක්‍රම නිර්මාණය කරයි.'
>
> *-මනෝ චිකිත්සක උපදේශක, මුස්ලිම්-*

මංකොල්ලකන ලද ඉඩම්, නිවාස හා දේපළ නැවතත් ඒවායේ හිමිකරුවන්ට ලබාදීමට රජය විසින් යාන්ත්‍රණයක් සකස් කළ යුතු අතර එය සාමයේ තිරසරභාවයට හා සංහිඳියාවේ ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීමට දායක වේ.

රාජ්‍යයේ හා එහි නිළධාරීන්ගේ අන්තවාදී ආකල්ප වෙනස්කළ යුතු අතර සංහිඳියාව රාජ්‍ය ප්‍රතිපත්තියේ කොටසක් බවට පත්කළ යුතුය. ඒ අනුව, පවත්නා ගැටලු විසඳීම සඳහා දිගුකාලීන විසඳුම් සකස් කළ යුතුය.

කාන්තාවන් නොමග යවන්නාවූ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් හා විදේශ රැකියා නියෝජිතායතන වැනි සූරාකෑමේ ආයතන රජය විසින් වළක්වාලිය යුතු වේ. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සන්දර්භය තුළ පැන නැගී ඇති මෙම අභියෝගයන්ට එරෙහිව රජය විසින් කටයුතු කළ යුතුය.

කොළඹ සිටින රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයන්ට එවැනි ප්‍රතිපත්ති සම්පාදනය කළයුතු බිම් මට්ටමේ යථාර්ථයන් පිළිබඳව අවබෝධයක් ඇති කිරීමට අවශ්‍ය වන පරිදි බිම් මට්ටමේ කාන්තාවන් සමඟ වෙනත් අන්තර්ක්‍රියාකාරී සැසිවලට ප්‍රවේශවීමට රාජ්‍ය විසින් සංහිඳියා ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

සංහිඳියා ක්‍රියාවලිය තුළ කාන්තාවන්ව වඩාත් උපායශීලිව සහභාගී කරවීම සඳහා රජය විසින් අත්‍යාවශ්‍ය පියවර ගත යුතුය. සංහිඳියා ක්‍රියාවලියේදී කාන්තා සහභාගීත්වය වැඩිකළ යුතුය. කාන්තාවන්ගේ අදහස් අවංකව රාජ්‍ය උපායමාර්ගික සැළසුම්කරණයට ඇතුළත් කළ යුතුය.

*මෙම ග්‍රන්ථයෙහි ප්‍රකාශකර ඇති අදහස් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූවන්ගේ අදහස් වන අතර, ඒවා අවශ්‍ය වශයෙන් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය, ශ්‍රී ලංකා හි අදහස් සහ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.*

ප්‍රථම මුද්‍රණය 2019 මැයි මස ශ්‍රී ලංකාවේ දී

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice)**
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05
දුරකථන/ෆැක්ස්: +94 11 2055404 / 2501457
විද්‍යුත් තැපෑල: srilanka.cej@gmail.com | වෙබ් අඩවිය: www.cejsrilanka.org
https://www.facebook.com/Centre-for-Equality-and-Justice https://twitter.com/CEJ_SriLanka https://www.instagram.com/cej_srilanka/